# අධ්‍යාපන අමාත්‍යාංශය

# ජාතික වැඩසටහන් කළමනාකරු / වැඩසටහන් ප්‍රධානී සඳහා බඳවා ගැනීම

## ද්විතීයික අධ්‍යාපන ආංශික වැඩිදියුණු කිරීමේ වැඩසටහන (SESIP)

අධ්‍යාපන අමාත්‍යාංශය යටතේ ඇති ද්විතීයික අධ්‍යාපන ආංශික වැඩිදියුණු කිරීමේ වැඩසටහනට අදාළව ආංශික නියාමන හා තාක්ෂණික සහයෝගීතා ඒකකයෙහි පහත සඳහන් තනතුර සඳහා ශ්‍රී ලංකාවේ සුදුසුකම්ලත් හා පළපුරුදු පුද්ගලයන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

ශ්‍රී ලංකාවේ සමස්ත ද්විතීයික අධ්‍යාපන අංශය ප්‍රතිසංස්කරණය කිරීම සඳහා රජය දරන උත්සාහයට මෙම වැඩසටහන තවදුරටත් සහාය වන අතර එමගින් ඉතා උසස් ආර්ථිකමය අදාළත්වයක් ඇති විද්‍යාව, තාක්ෂණවේදය, ගණිතය හා වාණිජ්‍යය යන විෂය ධාරාවන්හි ඉගැන්වීම් හා ඇගයීම් ක්‍රමවේද ඇතුළත් ප්‍රතිසංස්කරණ සිදු කෙරේ.

මෙම වැඩසටහන Covid-19 බලපෑම් මත ගොඩනැගෙන ඩිජිටල් තාක්ෂණය පදනම් කරගත් ඉගෙනීම් ක්‍රියාවලියක් වන අතර එමගින් Covid-19 මගින් ඇති කරන අයහපත් ප්‍රතිඵල හා අනාගතයේ ඇතිවිය හැකි එවැනි බලපෑම්වලට මුහුණදීම සඳහා අධ්‍යාපන පද්ධතියේ ප්‍රත්‍යස්ථිතිය වැඩිදියුණු කරයි.

ද්විතීයික අධ්‍යාපන ආංශික වැඩිදියුණු කිරීමේ වැඩසටහන රජයේ අධ්‍යාපන ආංශික සංවර්ධන සැලැස්ම (2020-2025) මත පදනම්ව එයට සහාය දක්වන අතර එම වැඩසටහන මගින් අපේක්ෂා කරන අරමුණු ජාතික ප්‍රතිපත්ති රාමුව වන සෞභාග්‍යයේ දැක්ම හා අනුගත වේ. ද්විතීයික අධ්‍යාපන ආංශික වැඩිදියුණු කිරීමේ වැඩසටහන සඳහා ආසියානු සංවර්ධන බැංකුව මගින් ප්‍රතිඵල පදනම් කරගත් මූල්‍ය සහාය ලබාදේ.

වැඩසටහන් කළමනාකරු / වැඩසටහන් ප්‍රධානී විසින් කාලෝචිත හා ඵලදායී වැඩසටහන් සැලසුම් කිරීම හා කළමනාකරණය අදාළ රාජ්‍ය අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු, ආයතන සහ පළාත් 09 හි පළාත් අධ්‍යාපන බලධාරීන් සමග සම්බන්ධීකරණය කරමින් වැඩසටහනේ ප්‍රගතිය රජයට හා ආසියානු සංවර්ධන බැංකුව වෙත වාර්තා කිරීම කළයුතු වේ.

| තනතුර | තනතුරු ගණන | කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමතිය අනුව සේවා මට්ටම | සුදුසුකම් හා පළපුරුද්ද | වයස |
|---|---|---|---|---|
| වැඩසටහන් කළමනාකරු / වැඩසටහන් ප්‍රධානී | 01 | ව්‍යාපෘති කාර්යමණ්ඩල (PS) -1 | විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් අදාළ ක්ෂේත්‍රය පිළිබඳ සාර්ථකව සම්පූර්ණ කරන ලද උපාධියක්<br>හෝ<br>අදාළ ක්ෂේත්‍රයේ උපාධියට සමාන සුදුසුකමක් ලෙස විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් සුදුසුකමක්<br>හා<br>අදාළ ක්ෂේත්‍රයේ පශ්චාත් උපාධියක් සමග පිළිගත් වෘත්තීය ආයතනයකින් ලබාගත් ආයතනික/වරලත් සාමාජිකත්වය හෝ ඒ හා සමාන වෘත්තීය සුදුසුකමක්<br>සමඟ<br>අවම වශයෙන් වසර 12ක කළමනාකරණ මට්ටමේ පශ්චාත් සුදුසුකම් හා පළපුරුද්ද සහ එයින් වසර 06ක කාලයක් ජ්‍යෙෂ්ඨ කළමනාකරණ මට්ටමේ පළපුරුද්ද | අවුරුදු 45 55ත් අතර විය යුතුය. |

මෙම තනතුරට අදාළ සුදුසුකම්, වැටුප් පරිමාණ ඇතුළු වැඩිවිස්තර සඳහා 2019 මාර්තු 05 දිනැති කළමනාකරණ සේවා දෙපාර්තමේන්තු චක්‍රලේඛ 01/2019 හා විධිවිධාන පරිශීලනය කළ හැකිය. (www.treasury.gov.lk/web/management-services-department-circular/section/2019)

රාජ්‍ය සේවාවන්ට අයත් නිලධාරීන් පූර්ණ කාලීනව නිදහස් කිරීමේ පදනම මත (Secondment Basis) බඳවා ගන්නා අතර රාජ්‍ය සේවයෙන් පරිබාහිර නිලධාරීන් කොන්ත්‍රාත් පදනම මත බඳවාගනු ලැබේ. ආරම්භයේ දී මෙම පත්වීම වසරක කාලසීමාවක් සඳහා වන අතර සේවා කාලය දීර්ඝ කිරීම තනතුරේ සාර්ථක කාර්යසාධනය මත තීරණය වේ.

සුදුසුකම් හා පළපුරුද්ද මත ලැයිස්තුගත කර ඇති අයදුම්කරුවන් සම්මුඛ පරීක්ෂණය සඳහා කැඳවනු ලැබේ.

අයදුම්කරුවන් විසින්ම සකස් කරන ලද අයදුම්පත, තොරතුරු විමසීම සඳහා ඥාතීන් නොවන දෙදෙනෙකු ඇතුළත් කරමින් සකස් කරන ලද ජීව දත්ත පත්‍රිකාව හා අධ්‍යාපන හා වෘත්තීය සුදුසුකම් සනාථ කෙරෙන ලේඛනවල පිටපත් සමඟ ලියාපදිංචි තැපෑලෙන් පහත ලිපිනය වෙත එවිය යුතුය. එමෙන්ම, එහි ස්කෑන් පිටපත් adsec-admin@moe.gov.lk විද්‍යුත් තැපෑල මගින් ද ඉදිරිපත් කළ හැකිය. තව ද ඉහත ලිපි පෙර සඳහන් ලිපිනය වෙත පැමිණ භාරදීමට ද අවස්ථාව ඇති අතර භාරදුන් බවට තහවුරු කිරීමක් ලබා ගැනීම වැදගත් වේ. අයදුම්පත් භාරදීමේ අවසාන දිනය 2021 නොවැම්බර් 02 වේ.

වැඩසටහනේ නම (ද්විතීයික අධ්‍යාපන ආංශික වැඩිදියුණු කිරීමේ වැඩසටහන/SESIP) සහ අයදුම් කරන තනතුර අයදුම්පත බහා ඇති ලියුම් කවරයේ ඉහළ වම් කෙළවරේ සඳහන් කළ යුතුය.

මෙම තනතුර සඳහා අයදුම් කිරීමට කැමති රාජ්‍ය හෝ පළාත් රාජ්‍ය සේවාවන්හි නියුතු නිලධාරීන් අදාළ ආයතන ප්‍රධානීන් හරහා තමන් පූර්ණ කාලීනව නිදහස් කළ හැකි ද නොහැකි ද යන්න පිළිබඳව ඔවුන්ගේ නිර්දේශය ද සහිතව අයදුම්පත යොමු කළ යුතුය.

**මහාචාර්ය කේ. කපිල සී.කේ. පෙරේරා**

**ලේකම්,**
**අධ්‍යාපන අමාත්‍යාංශය,**
**ඉසුරුපාය,**
**බත්තරමුල්ල.**